**පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාව**

**මුලතිව් දිස්ත්‍රික්කය**

---------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 18 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 මැයි 05 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. 11,682,016 ක්වූ වර්ග 05 කට අයත් හිඟ හිටි ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. වර්ෂ 1 සිට 5 දක්වා කාල පරිච්ඡේදයක් තුල මේවා ලැබිය යුතු ශේෂ වශයෙන් ගිණුම්වල පෙන්වා තිබුණි.

(ආ) රු. 120,414 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබූ අතර තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

## 1.3.4 **නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත අවස්ථාවන් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) පරිච්ඡේදය 111 රීතිය 24 | ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර වසර තුනක් ඇතුලත සභාව සතු මහා මාර්ග සහ මංමාවත් වල විස්තර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය 111 රීතිය 33 | සමාලෝචිත වර්ෂයේ වරිපනම් තක්සේරු සිදු කර නොතිබුණි. |
| (iii) පරිච්ඡේදය v රීතිය 140 | එකතුව රු. 424,367 ක් වූ වර්ෂය 4 සිට වර්ෂ 05 ක පරාසයක ඇති නොපියවූ අත්තිකාරම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (iv) පරිච්ඡේදය 1x රීතිය 180 | මුදල් හා තොග භාණ්ඩ සම්බන්ධයෙන් ඇප සුරක්ෂිත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය. | සභාව සතු වාහන 13 ක ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන 2006- මාර්ගෝපදේශක අත්පොත 5.4.12 වගන්තිය | එකතු කළ අගය මත බදු (VAT) සභාව විසින් ගෙවීම් කිරීමෙන් පසු එහි විස්තර එළඹෙන මාසයේ 15 වන දිනට ප්‍රථම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවටද එහි පිටපතක් විගණකාධිපතිවරයාටද යවා නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 571 | වර්ෂ 02 ක් ඉක්මවූ රු. 2,172,135 ක් වටිනා වර්ග තුනකට අයත් තැන්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 31,827,810 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 20,046,620 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 11,781,190 ක වර්ධනයක් විය. පුනරාවර්තන ප්‍රදාන සහ පුනරාවර්තන ආදායම් වර්ධනය වීම මෙම වර්ධනයට ප්‍රධාන හේතුන් වී තිබුණි.

2.2. **විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය**

-------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ,පෙර වර්ෂයේ රු. 77,931 ක ශුද්ධ අතිරික්තයක සමඟ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය වූ රු. 69,811 ක ශුද්ධ අතිරික්තය සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 8,120 ක පරිහීමක් සිදු වී තිබුණි.

2.3 **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**කාරක ප්‍රාග්ධන කලමනාකරණය**

------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පෙර වර්ෂයේ රු. 39,206,303 ක කාරක ප්‍රාග්ධනය සමඟ සමාලෝචිත වර්ෂයේ රු. 59,007,059 ක කාරක ප්‍රාග්ධනය සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 19,800,756 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4. **ආදායම් පරිපාලනය**

---------------------

2.4.1 **වරිපනම් හා බදු**

----------------

1988 (ප්‍රාදේශීය සභා මූල්‍ය සහ පරිපාලන) රීතිවල පරිච්ඡේද 111 හි 32 වන රීතියේ නියමයන් ප්‍රකාරව වරිපනම් බදු තක්සේරුව පිළිබඳ ලේඛනය නඩත්තු කර නොතිබුණි.

2.4.2 **විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු අය කිරීම**

-----------------------------------------------

2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රයේ නියමයන් ප්‍රකාරව ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුල ඉදිකර ඇති විදුලි සංදේශ කුළුණු 11 ක් සම්බන්ධයෙන් සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම ආරම්භක සැලසුම් අනුමත කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ ආවරණ අනුමැතීන් වැනි වර්ග හතරක ගාස්තු අයකර ගෙන ගිණුම්වලට ගෙන නොතිබුණි.

2.4.3 **මුද්දර ගාස්තු**

--------------

ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් අයකර ගත යුතුව ඇති සභාවට ලැබිය යුතු වර්ෂ 01 සිට වර්ෂ 05 ක කාල පරාසයකට අදාල වූ එකතුව රු. 1,112,726 ක මුද්දර ගාස්තු අයකර ගැනීමට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන කොමසාරිස් ජනරාල් වරයා විසින් ප්‍රදානය කර ඇති සභාව විසින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට භාවිතා කරනු ලබන වාහන 24 ක අයිතිය පවරා ගැනීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභාවේ කාර්ය මණ්ඩලයේ ඇති වී තිබූ පුරප්පාඩු 19 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 **වත්කම් කළමනාකරණය**

---------------------------

මුදල් රෙගුලාසි 756 සහ 757 නියමයන් ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ ඒවා සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.3 අත්හැර දමන ලද ව්‍යාපෘතින්

------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද රු. 40,762,500 ක පිරිවැය වූ ප්‍රාග්ධන වැඩ 17 ක් අත්හැර දමා තිබූ අතර එසේ ව්‍යාපෘති අත්හැර දැමීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

------------------------

අවශ්‍ය ප්‍රමාණයට මූල්‍ය සම්පත් නොමැති ප්‍රජා පාදක සංවිධානවලට සභාවේ ප්‍රසම්පාදන කමිටු නිර්දේශ නොමැතිව සෘජුවම කොන්ත්‍රාත් ලබාදී තිබුණි. මෙය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2012 ජනවාරි 05 දිනැති හා අංක 1/2012 දරන චක්‍රලේඛයේ නියමයන්ට පටහැනි ක්‍රියාවකි. විගණනය විසින් කොන්ත්‍රාත් වැඩ වල ප්‍රගතිය ඉල්ලා සිටියද ඒවා ඉදිරිපත් කර නොකෙරිණි.

3.5 **ප්‍රමාද වී ඇති ව්‍යාපෘති**

------------------------

එකතුව රු. 3,646,325 ක් වටිනා ව්‍යාපෘති 07 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රදානය කොට වැඩ ආරම්භ කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ව්‍යාපෘතිවල වැඩ අවසන් කර නොතිබුණි කෙසේවුවද, මෙම ව්‍යාපෘතිවල වටිනාකම වූ රු. 3,646,325 ක මුදල වියදම් වශයෙන් ගිණුම්වල පෙන්වා තිබූ අතර විවිධ ණයහිමියන්ගේ ගිණුමට සමාලෝචිත වර්ෂයේදී බැර කර තිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් වැඩ අවසන් කිරිමට සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3.6 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැලි කසළ පිළිස්සීම සහ පස්වලින් යට කිරිම යන ක්‍රියාමාර්ග පමණක් සභාව විසින් අනුගමනය කර තිබුණු අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරන වැඩ සටහන් අනුගමනය කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

4.1 ඵලදායි යාන්ත්‍රනයක් වශයෙන් උපයෝගි කර ගැනීම සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. එබැවින් ඇස්තමේන්තුගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර රු. 4,000 සිට රු. 14,456,482 පරාසයක විචලනයක් ඇති වී තිබූ අතර ඇස්තමේන්තුගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 41,939 සිට රු. 2,394,652 ක විචලනයක් ඇති වී තිබුණි.

4.2 **ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 4.2 වගන්තියේ නියමයන් ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී සභාවේ ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාල වකවානු සකස්කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

------------------------

ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදු නොවන බැවින් අභ්‍යන්තර පාලනය අදාල පරිදි ක්‍රියාත්මක වී නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

----------------------------------------------

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2009 ජුනි 09 දින හා DMA/2009(1) අංක දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු හතරක් (04) වත් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එකදු රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ආදායම් රැස්කිරීම
(ii) ස්ථාවර වත්කම්
(iii) ගිණුම් කරණය
(iv) සේවක සංඛ්‍යාව
(v) වාහන උපයෝජනය
(vi) විවිධ තැන්පත්
(vii) අයවැය පාලනය
(viii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය